උසාවිය යනු ලංකාවේ උසාවියයි. උසාවිය ඇතුළත කරන කියන දේ ගැන ලිවීම මෙල්බර්න් නුවර නීති සමාගමකින් අලාභ ඉල්ලා එවන ලිපියක් ලබාගැනීමේ සුදුසුකමක් විය හැකි හෙයින් මම ඇතුළට කර පෙවීමෙන් වැළකී පිටත - ඒ අබියස සිදුවන දේගැන පමණක් ලිවීමට තීරණය කළෙමි.

මා දකිනා උසාවිය ඉදිරිපිට සිටින්නේ වරදකට හසු වී එහි ගෙන එනු ලබන

මිතුරා අමනාප වන්නටද ඇත. එහෙත් මට එය නොකියා සිටිය නොහැකි විය. මා ඒ ගැන ලියනවා නම් ලිවිය යුතුව තිබුණේ මහ සඟ රුවන ළඟ සිටින කඳ පනුවන් ගැන ය. ඒ පනුවන් විනාශකිරීම ගැන ය.

ප්‍රදර්ශනයට උපන්දින සාද පවත්වමින් පුවත්පත් මගින් මහා ප්‍රචාරයක් ලබා ගන්නා බොරු රහත් කාරයන් ගැන විමසා

නොවන්නේ ඔය කියාපු පසුබිම නිසා ය. මම බොරුකාරයන්ට හා සෝබන කාරයන්ට කිසි ගරු සරුවක් නොදක්වන්නෙක්මි.

මගේ ලංසුවට අනුව බෙංගමුවේ නාලක හිමියන් අයත් වන්නේ ඒ ගණයට ය. මගේ තක්සේරුවට හොහෝ දෙනා මනාප නොවන බවද මම දනිමි. මට මගේ මතය කිසිවකු පිට




# උසාවිය අබියස



දේශපාලකයෙකි. සමහරවිට ඒ ජාතියේ ලේකම් කෙනෙකි. ඔවුනගේ සම්ප්‍රාප්තිය පවා අති විශාල ජනකායක් ඔවුන් වටා රැස් කර ගැනීමට සමත් වන මහා ජාතික උත්සවයක් නොහොත් ජාතික සැණකෙළියක් බවට පත් වීම සුපුරුදු පිළිවෙලය. එයත් ශ්‍රී ලාංකික වාසනාවක් බව කිව යුතුය.

නමක් සඳහන් කරමින්ම තත්වය විස්තර කිරීම හිතකර බව සිතමි. නිතර දෙවේලේ දැන් උසාවියට පිවිසෙන හිටපු ඇමතිවරයකු වන විමල් වීරවංශ ගැන කියමු. මාංචු සහිත දොහොත් ඔසොවා ඔහු කරන ආචාරයට ලක් වන පිරිස අතර ගිහි පැවිදි දෙපාර්ශවයම සිටීමද පොදු ප්‍රවණතාවක් බවට පත්ව ඇත. බෙංගමුවේ නාලක හිමියන් සිටීම ගැන මම පුදුම නො-වන්නෙමි. උන්වහන්සේ මෙල්බර්න් නුවරට ආපු වෙලාවක කරපු කතාවද මට මතකය. ඒ ත්‍රස්තවාදය දැඩිව පැවති අවදියයි.

"අපි සකස් කරලා තියනවා ගම් මට්ටමෙන් පන්සල මධ්‍යස්ථානය කරන වැඩ පිළිවෙලක්... නියම වෙලාව අපුවහම අපි එය දියත් කරනවා"

එදා රැස්ව සිටි බොහෝ දෙනා සල්ලි එකතු කොට නාලක හිමියන්ට පූජා කළහ. මට ඒ පිනට හිතක් ආවේ නැත. එදා මා තුළ පැවති සැකය දුරු වූයේද නැත. ඔය කියන වැඩ සටහන අමූලික බොරුවක් ය යන අදහස මගේ සිතෙන් ඉවත් කරන්නට නොහැකි විය. ඒ කිව්වා වාගේම එහෙම දෙයක් දියත් කෙරුණේද නැත.

සිඩ්නිවාසී මගේ මිතුරකු විසින් එවන ලද පොතක් මට මතකය. පොත ලියා තිබුණේ ඔය කියන නාලක හිමියන් ය. පොතේ නම " බොදු සසුන වනසන කළු කඳ පණුවෝ" යන්න ය. මිතුරා මගෙන් අපේක්ෂා කළේ ඒ ගැන මා ලියනු ඇතැයි කියාය. මම ඔහුට පිළිතුරු ලිපියක් යැවුවෙමි.

"ශාසනය වනසන කඳ පණුවන් ගැන බලා ගැනීම මහා නායන හිමියන්ගේ වගකීමයි. මම ඒ වාගේ කොන්තරාත් බාර ගන්නේ නැත"

සිවුරක් පොරවාගෙන පල්ලිවලට කඩා පැන මුස්ලිම් ජනයාට බහර දෙන - රජයේ නිලධාරීන්ට තර්ජනය කරමින් අපහාස කරන පුද්ගලයන් ගැන සොයා බලා

මෙබඳු හොර ගෙඩියන් ගැන වචනයක් නො-දොඩා තමන්ගේ පන්සලට අයත් දේපළ පිලිබඳ මතභේද නිසා මෙරටට පැන විරෝධය පෑමට සිතන මහනායක හිමිවරුන් ගැන සිතා බලා

පන්සලේ දන්කැටයට දමනු ලබන ලක්ෂ ගණන් මුදලින් අඹුදරුවන් නඩත්තු කරන මහා බලගතු නායක හිමිවරුන් ගැන සොයා බලා

කළ යුතු ගත යුතු ක්‍රියා මාර්ගය තීරණය කළ යුතුව තිබිය දී නමට පමණක් පොතක් ලියා රටට ලොවට අඬගා කරන ගෝසාවෙන් ඇති වැඩක් නැති බව මා කියා දිය යුතු කරුණක් නොවේ. ඒ සියලුම දේ ගැන ඔය කියන පඬිවරු දනිති. මුව වසාගෙන සිටිති. ඒ කා රවටන්නටද?

මම තවමත් අතරමග සිටිමි. යන්නට ගිය ගමන පටන් ගත්තා විතර ය.

නාලක හිමියන් උසාවියට ගොස් විමල් වීර-වංශට පිරිත් නූලක් බැඳීම මට අරුමයක්

පැටවීමට ශක්තියක් හෝ බලයක් හෝ නැත.

මගේ පුදුමය එබඳු තැනක නිතර ම පාහේ දක්නට ලැබෙන ගිහියන් පිළිබඳව ය. ගුණදාස අමරසේකර මට වඩා වසර තුනක්

මට මතක ය. ඔහු එදා එන් එම් හැඳින්-වූයේ මුනිවරයකු ලෙසින් ය.

මට සිතා ගත හැකි අයුරින් ඒ නිගමනය හෙවත් ගෞරවය ඔහු වෙනුවෙන් කිරීමට ගුණදාස තීරණය කරන්නට ඇත්තේ මියගිය නායකයාගේ දේශපාලනයට වඩා උගත්කමත් බුද්ධියත් නිසා බව කිව හැකි ය. මම එක් වතාවක් පමණක් වත්මන් එන් එම් පෙරේරා කේන්ද්‍රයේ පිහිටි ඔහුගේ කාමරයට ගොස් වචනයක් දෙකක් කතා කිරීමට අවසර ලද්දෙක්මි. ඒ තාපසයා වෙතින් පළ වූ ශාන්ත ස්වභාවය සුදු මුදු ගුණය මගේ සිත්හි තදින් කා වැදී ගිය එකක් ය.

ගුණදාස අමරසේකරට මා ගරු කිරීමට සිතුවේ එබඳු බුද්ධි මහිමයක් හා උත්තම මනුෂ්‍ය ස්වභාවයක් ඔහු වෙතින් පළ වූ නිසා ය. යටත් පිරිසෙයින් මා එසේ සිතූ නිසා ය.

දැන් බැලූ කොට මගේ නිගමනය සහ මා ඔහුට දැක් වූ ගෞරවය යන දෙකම අනීව-ාරතේ ගිය දේවල් බව මට කිව හැකි ය.

ගුණදාස අමරසේකර එක් දෙයක් මට පැහැදිළි කරදීමට සමත් වූ බව දැන් මට කිව හැකි ය. ඒ මා විසින් කලක් තිස්සේ අනුමාන කරන ලද ශ්‍රී ලාංකික දුබලතාවකි. එනම් රටට අත්‍යවශ්‍ය බුද්ධිමය

***ගුණදාස අමරසේකරට මා ගරු කිරීමට සිතුවේ එබඳු බුද්ධි මහිමයක් හා උත්තම මනුෂ්‍ය ස්වභාවයක් ඔහු වෙතින් පළ වූ නිසා ය. යටත් පිරිසෙයින් මා එසේ සිතූ නිසා ය.***
***දැන් බැලූ කොට මගේ නිගමනය සහ මා ඔහුට දැක් වූ ගෞරවය යන දෙකම අනීවාරතේ ගිය දේවල් බව මට කිව හැකි ය.***

පමණ පසුව ජ්‍යේෂ්ට පාඨශාලා පරීක්ෂණයට පෙනී සිටි නාලන්දාවේ ශිෂ්‍යයෙකි. මම ඔහු මෙලබර්න් දේශනයකට පැමිණි අවස්ථාවකදී එහි ගොස් ඔහු මුණ ගැසුණෙමි. දේශනයට වඩා පුද්ගලයාට මා ගරු කළ හෙයිනි. දේශපාලකයන් පසුපස නොගිය මාර්ටින් වික්‍රමසිංහ වැනි ලේඛකයන් ගුණසේන විතාන බඳු ප්‍රගතිශීලී ලේඛකයන් අනුග්‍රහයෙන් සෙ-ෝවියට් දේශයට ගොස් "සෝවියට් දේශයේ නැගීම" නමින් ඇදහිය නොහැකි කතාවක් සහිත පොතක් ලියන අතර එබඳු කිසිම බලපෑමක් හෝ අනුග්‍රහයක් නිසා සිය ස්ථාවරය වෙනස් නොකළ අදීන ලේඛකයකු වන මා ගරු කළ පුද්ගලයෙකි. ආචාර්ය එන් එම් පෙරේරා මිය ගිය පසු ඔහු ලියූ කවක්ද

ක්‍රියාකාරීත්වයක් සැපයීමට සමත් පිරිසක් අ දරට තුළ නොමැති බව ය.

ඒ නිගමනය පවා අසාධාරණ විය හැකිය. මා නොසිතන නොපතන තැන් වලින් මතුවීමට ඉඩ ඇති බුද්ධිමය ක්‍රියාකාරීත්වයක් දිවයිනේ තිබිය හැකි ය. මරේ ඇස් දුබල නිසා එබන්දක් මට නොපෙනෙනවාද විය හැකිය. එයට දොස් කීමට කිසිවකුට වුව ද ඉඩක් නැත .

මට සමාවනු මැනැවැයි කීම හැර කියන්නට කිසිවක් මට නොමැති ය.